ත්‍රිපිටකය » සූත්‍ර පිටකය » සංයුත්ත නිකාය » නිදාන වර්ගය » 7. ලක්ඛණ සංයුක්තය » 1. ප්‍රථම වර්ගය

# 7.1.3. මංසපිණ්ඩසුත්තං

# 7.1.3. මාංසපිණ්ඩ සූත්‍රය

364. ඉධාහං ආවුසො, **ගිජ්ඣකූටා** පබ්බතා ඔරොහන්තො අද්දසං මංසපිණ්ඩං වෙහාසං ගච්ඡන්තං. තමෙනං ගිජ්ඣාපි කාකාපි කුලලාපි අනුපතිත්වා අනුපතිත්වා විතච්ඡෙන්ති, විරාජෙන්ති. සො සුදං අට්ටස්සරං කරොති -පෙ- [අථ ඛො භගවා -පෙ-] එසො භික්ඛවෙ, සත්තො ඉමස්මිං යෙව රාජගහෙ සාකුණිකො අහොසි -පෙ- [එවරූපං අත්තභාවපටිලාභං] පටිසංවෙදයතීති.

364. ඇවැත්නි, මෙහි මම **ගිජුකුළු** පව්වෙන් බස්නෙම් අහසෙහි ගමන් කරණ මස්පිඩක් (වූ ප්‍රෙතයකු) දිටිමි. ගිජුලිහිණියෝත් කවුඩෝත් උකුස්සෝත් ඒ මෙය ලුහුබඳිමින් කඩා කත් ,ඉරා කත්. ඒ මස් පිඩ ද බැගෑහඬ නගයි ... මහණෙනි ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ... මේ සත්ත්වතෙමේ මේ රජගහනුවර ම ලිහිණි වැද්දෙක් විය. ... ඒ කර්මයාගේ විපාකාවශේෂයෙන් මෙබඳු අත් බැව් පිළිලැබීමක් විඳී යි වදළ සේක.